**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Cmmonwealth
BSB - 063619
Ac - 10852409

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්4ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# කැස්සට හෙම්බිරිස්සාවට ආණ්ඩු පෙරළීම

**අජිත් පැරකුම් ජයසිංහ**



මේ රටේ දේශපාලන ක්‍රමය ඉතා පසුගාමී, දූෂිත එකක් බව අමුතුවෙන් කිව යුතු නැත. එයින් බිහි වන්නේ අඳබාල නායකයන් බව නො දන්නා කෙනෙකු නැත. මෛත්‍රීපාල සිරිසේන හෝ රනිල් වික්‍රමසිංහ හෝ මහින්ද රාජපක්ෂ හෝ අනාගතයේ පෙනෙන කිසිම දුරක සිටින කිසිම දක්ෂිණාංශික හෝ මධ්‍යස්ථ හෝ වාමාංශික හෝ නායකයකු සම්බන්ධයෙන් බලාපොරොත්තු තැබීම තේරුමක් නැත.

අප දේශපාලකයන් රාජ්‍ය නායකත්වයට පත් කර ගන්නේ ඔවුන් හොඳ නායකයන් නිසා නො වේ. අපට ඔවුන් තෝරා ගන්නේ අපට සිටින අය අතුරිනි. ඔවුන් ඉතා බොළඳ, පහත්, කෲර අයුරින් හැසිරීමට ඉඩ ඇති අය බව අප දැන සිටිය යුතු ය. පුරවැසියන් ලෙස අපගේ වගකීම වන්නේ ඔවුන්ට ඉදිරියෙන් සිටීම මිස ඔවුන් පසුපසින් වැටී කලකිරීම නො වේ.

වර්තමාන මොහොත තේරුම් ගත යුත්තේ එසේ ය. කලකිරීමට පත් ජනයා වෙත බල ව්‍යාපෘති තල්ලූ කිරීම දේශපාලනයේ කොටසකි. එහෙත්, හෙම්බිරිස්සාවට, කැස්සට පවා ආණ්ඩු පෙරළිය යුතු යයි කියන බලලෝභීන්ගෙන් ජනතාව පරිස්සම් විය යුතු ය.

මේ මොහොතේ ද නැවතත් දකින්නට ලැබෙන්නේ මේ ආණ්ඩුව පෙරළා රාජපක්ෂ පවුල බලයට එන්නට දත කන ස්වභාවයකි.

ඔවුන්ට බලය ඉතා හදිසි වී තිබෙන්නේ ඔවුන්ට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ග වළක්වා ගැනීමට බව මහජනතාව ලෙස අප තේරුම් ගත යුතු ය. ඔවුන් පසුපස අන්ධ භක්තියකින් ගාටන පසුගාමී, ජාතිවාදී මහජන බලවේගය පාවිච්චි කර ඔවුන් අවසානයේදී කරන්නේ අන් යමක් නොව, මෙන්න මේ ඔවුන්ගේ පවුලට පමණක් වැදගත් වැඩේට ඩීල් දා ගැනීම ය.

රජයෙන් යැපෙන බොහෝ මධ්‍යම පංතිකයන්ට තමන් ලබන ආදායමේ තරමට හෝ මහජනතාවට වැඩක් කිරීමට උවමනාවක් නොමැත. තමන්ගේ රැකියාව හරියට නො කරන මොවුන් ඇතැමෙක් තම මුළු කාලය ම යොදවා තිබෙන්නේ කඩාකප්පල්කාරී දේශපාලනයටයි.

**මේ මොහොතේ ද නැවතත් දකින්නට ලැබෙන්නේ මේ ආණ්ඩුව පෙරළා රාජපක්ෂ පවුල බලයට එන්නට දත කන ස්වභාවයකි. ඔවුන්ට බලය ඉතා හදිසි වී තිබෙන්නේ ඔවුන්ට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ග වළක්වා ගැනීමට බව මහජනතාව ලෙස අප තේරුම් ගත යුතු ය.**

කඩාකප්පල්කාරීන් 200ක් විතර ඉන්න තැනක් දියවන්නාව අසබඩ තියෙනවා. උන් දෙන ආදර්ශය අනුව තමයි රාජ්‍ය ආයතන, සිවිල් සංවිධාන, මාධ්‍ය හා ජනතාව වන අප ක්‍රියා කරන්නෙ. දාහක් ප්‍රශ්න තියෙද්දි අපි කතා කරන්නෙ ඒවා විසඳා ගන්න හැටි නෙමෙයි. ඒ සඳහා පවත්නා ක්‍රම සහ විධි යහපත් කර ගන්න හැටි නෙමෙයි. හැම කැස්සකට, හෙම්බිරිස්සාවකට ම අප කතා

8 වන පිටට




